පොදු චක්‍රලේඛ අංක: 02 - 176/2014 දිනය: 2014.12.19

පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 10.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 34,
ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

සියළුම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

සියළුම ආයතන ප්‍රධානීන්,

**<u>පැරණි හා නව සිගරට් තොග වලට අදාලව දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ රූපමය සෞඛ්‍ය අවවාද (ලේබල් කිරීම හා ඇසුරුම් කිරීම) පිළිබඳ නියෝග ක්‍රියාත්මක කිරීම</u>**

2013.03.04 දිනැති අපගේ පූර්ව ලිපිය හා සබැඳේ.

ලේබල් කිරීම හා ඇසුරුම් කිරීම සම්බන්ධ රූපමය සෞඛ්‍ය අවවාද පිළිබඳ නියෝග ප්‍රථම වරට අංක 1770/15 හා 2012.08.08 දිනැති ගැසට් පත්‍රයේ පල කරන ලද අතර එම නියෝග අභියාචනාධිකරණ නඩු අංක 336/12 දරණ රිට් අයදුම්පත මඟින් දුම්කොල සමාගම (Ceylon Tobacco Company PLC) විසින් අභියෝගයට ලක් කරන ලදී. සිගරැට් පැකැට්ටුවේ මතුපිට රූපමය සෞඛ්‍ය අවවාද සඳහා නියමිත ඉඩ ප්‍රමාණය 80% සිට 50% - 60% දක්වා අඩු කරන ලෙස අභියාචනාධිකරණය විසින් නියෝග කරන ලදී. අභියාචනාධිකරණයේ ඉහත නියෝගයට එරෙහිව දුම්කොල සමාගම විසින් නඩු අංක: SC/SPL/LA/85/2014 යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරන ලදී. අභියාචනාධිකරණ නියෝගය අනුව අමාත්‍යතුමා විසින් 2012.11.08 හා 2013.02.15 දිනැති ගැසට් පත්‍රය අවලංගු කරමින් සිගරැට් පැකැට්ටුවේ ඉදිරිපස සහ පිටුපස යන දෙපැත්තෙහි ඉහල මතුපිට ප්‍රදේශයේ රූපමය සෞඛ්‍ය අවවාද 60% විය යුතු බවට අංක: 1864/32 හා 2014.05.27 දිනැති ගැසට් පත්‍රයේ නියෝගයක් පළ කරන ලදී.

එකී ගැසට් පත්‍රය පල කිරීමෙන් අනතුරුව දුම්කොල සංස්ථාව හා එහි බෙදාහරින්නන් විසින් නඩු අංක: SC/FR/164/2014 සහ SC/FR/165/2014 යටතේ එකී නියෝගයේ අන්තර්ගත කරුණු අභියෝගයට ලක් කරමින් එම නියෝග නිෂ්ප්‍රභා කරන ලෙස හෝ ඒ අනුව කටයුතු කිරීමට වැඩිපුර කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් පවරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය ඉදිරියේ ඇති සියලු නඩු සලකා බලා දුම්කොළ සමාගම විසින් එකී සියලු නඩු ඉල්ලා අස් කර ගත යුතු බවටත්, අමාත්‍යාංශය දුම්කොළ සමාගමට ඒ අනුව කටයුතු කිරීම සඳහා මාස 06 ක කාලයක් ලබා දිය යුතු බවටත්, 2014.07.11 වන දින දෙපාර්ශවය අතර, එකඟතාවයකට එළඹෙන ලදී.

ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී නඩු නිෂ්ප්‍රභා කරමින් අධිකරණ නියෝගයක් ලබා දුන් අතර පහත සඳහන් උපදෙස් පිළිපැදීමට බලයලත් නිලධාරීන් වෙත දැනුම් දීම අවශ්‍ය බවට නියෝග කරන ලදී. අධිකරණ නියෝගය අනුව,

1. ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ප්‍රකාරව දුම්කොළ සමාගම හා අනෙකුත් අය විසින් 2015.01.01 දින සිට අංක: 1770/15 හා 2012.08.08 දිනැති හා අංක: 1864/32 හා 2014-05-27 දිනැති ගැසට් පත්‍රවල රෙගුලාසි වලට අනුව කටයුතු කළ යුතු වේ.

2. බෙදාහරින්නන් සතුව දැනට ඇති පැරණි තොග එකී නියෝග ප්‍රකාරව නියම කරන ලද රූපමය සෞඛ්‍ය අවවාද අඩංගු නොකර 2015.01.31 දිනට පසු විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතුය.

3. පැරණි තොග 2015.01.31 දින දක්වා විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම, බෙදා හැරීම, ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම සිදු කළ හැකිය. එබැවින්, 2015.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම නිෂ්පාදකයින්, ආනයනකරුවන්, සිල්ලර වෙළෙඳුන්, ගබඩා භාරකරුවන්, නියෝජිතයින් හා වෙළෙඳුන් සියළුම සිගරට් (නව හා පැරණි යන දෙවර්ගයේම) පැකට්ටුවලට පාර්සල්වලට සැහැල්ලු කාඩ්බෝඩ් පෙට්ටිවලට අදාලව ඉහත කී නියෝගයට අනුකූලව ක්‍රියා කළ යුතුය.

4. එබැවින්, 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2014.12.31 දිනට පසුව නිෂ්පාදනය කරන සියලුම සිගරට් පැකට් එකී නියෝගයට අනුකූලව නිෂ්පාදනය කළ යුතු අතර, එකී නියෝග ප්‍රකාරව නියමිත රූපමය සෞඛ්‍ය අවවාද පළ කිරීමෙන් තොරව විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම හෝ ප්‍රවාහනය කිරීම සිදු නොකළ යුතුය. මෙම අවශ්‍යතාව ආනයනය කරන ලද සිගරට් සඳහා ද අදාල වේ.

එබැවින්, 2014.10.14 දින සහ 1884/27 දරන ගැසට් පත්‍රයේ පල කරන ලද නව රෙගුලාසි අනුව, අනුකූල විය යුතු නව දිනය 2015.01.01 දින සිට විය යුතුය.

ඊට යටත්ව අභියාචනාධිකරණ රිට් අයදුම්පත්‍ර අංක: 336/2012 සම්බන්ධයෙන් ලබා දී ඇති අභියාචනාධිකරණ තීන්දුව ප්‍රකාරව අංක: 1770/15 හා 2012.08.08 දිනැති ගැසට් නිවේදනය හා සංශෝධිත අංක: 1864/32 හා 2014.05.27 දිනැති ගැසට් නිවේදනය හා අංක: 1884/24 හා 2014.10.14 දිනැති ගැසට් නිවේදනයන්හි රූපමය සෞඛ්‍ය අවවාද පහත කරුණු වලට යටත්ව 2015.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක විය යුතුය.

එබැවින්, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ ඔබ යටතට ගැනෙන සියළුම බලයලත් නිළධාරීන්ට, එනම්, පොලිස් නිළධාරීන්ට හෝ මහජන සෞඛ්‍ය නිළධාරීන්ට හා ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන්ට මේ අනුව කටයුතු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

**සුධර්මා කරුණාරත්න**
**සෞඛ්‍ය ලේකම්**

**පිටපත්:**
ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා
ලේකම්, අධිකරණ අමාත්‍යාංශය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
ලේකම්, ගුවන් තොටුපොල හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
නීතිපතී, නීතිපති දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, රේගුව
සභාපති, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය
සභාපති, වරාය අධිකාරිය
ආනයන පාලක
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ප්‍රධාන නීති නිලධාරී
අධ්‍යක්ෂ, බෝ නොවන රෝග
අධ්‍යක්ෂ, වෛද්‍ය තාක්ෂණ හා සැපයීම්